# ජනක ප්ලාස්ම ආනයනය සහ ශාක නිරෝධායන නීති

පේරාදෙණිය, ගන්නොරුවේ පැලෑටි නිරෝධායන අංශයේ

**ආර්. එස්. වයි. ද සිල්වා**

ජනක ප්ලාස්ම මොනවාද යන්නත් එවැනි දේ ආනයනය කිරීමේ වැදගත්කම , අවශ්‍යතාවය සහ ප්‍රයෝජනය යන කරුණු සියල්ල ගැන සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණ නොවේ. ශ්‍රී ලංකාවේ වගා කරන බෝගයන්ගෙන්, සමහර වී වර්ග, කුරුඳු, තල හැරුණුවිට, අන් සියළුම දෑ පිටරටින් ලබාගත් ශාකවීම, ජනක ප්ලාස්ම ආනයනය කිරීමේ වැදගත් කමට ඇති පැහැදිලිම ශාක්ෂියයි.

ජනක ප්ලාස්ම ගවේෂනයේදී, එම ගවේෂකයන් වැඩි උනන්දුවක් දක්වන්නේ හැකිතාක් ශාක එකතු කිරීමටය. බෝහෝවිට, එම ශාක පලිබෝධයන්ගෙන් නිදහස් වී දැයි සලකා බැලීමක් නොකරන තරමය.

—මෙහිදී, "පලිබෝධයා" යන්නෙන් අදහස් කරනු ලබන්නේ, ශාක හෝ ශාක වලින් ලබාගත් නිෂ්පාදනවලට හානි පමුණුවන්නාවූ සියළුම ජීවීන්ය.

පැලෑටි ජාන සම්පත් මධ්‍යස්ථානවලදී, අලුතින් ප්‍රවේශිත යම් ශාකයක වූ පලිබෝධයෙකු එයට නෑකම් දක්වන අනිකුත් ශාකවලට ආසාදනයවීම පහසුවෙන් සිදුවිය හැකිය.

ජනක ප්ලාස්මයන්ගේ ප්‍රභවය එකිනෙකට වෙනස් ස්ථාන වූ විට පැමිණිය හැකි පලිබෝධ යන්ගේ සංඛ්‍යාවද වැඩිවේ. එනම් අවදානම විශාලය.

මේ අනුව, ජනක ප්ලාස්ම ආනයනයේදී, ඒ සමග පැමිණිය හැකි පලිබෝධයන් නැවැත්වීමට උපක්‍රම යෙදීම අත්‍යාවශ්‍යය.

අළුත් ප්‍රදේශවලට පලිබෝධයන්ගේ ප්‍රවේශය සහ පැතිරීම වැළැක්වීම ශාක නිරෝධායනයේ පරමාර්ථය වේ. එම කාර්‍ය්‍යය නිවැරදි බව පෙන්වා දිය හැක්කේ, එම පලිබෝධයන්ට ස්වභාවිකව පැමිණිය නොහැකි නම් පමණි. එනම්, දැනුවත්ව හෝ නොදැනුවත්ව මිනිසාගේ උදව්වෙන් සිදු කරන පලිබෝධයන්ගේ ප්‍රවේශය වැළැක්වීමයි.

ශාක නිරෝධායනය යෙදවිය යුත්තේ පෙරහනයක් ලෙස මිස බාධකයක් ලෙස නොවේ. රට තුළට ජනක ප්ලාස්ම ආනයනය කළ යුතුය. එම ක්‍රියා වලියේදී පලිබෝධ නවත්වා, නිරෝග ශාක පමණක් රට තුළට වැද්ද ගත යුතුයි.

## ශ්‍රී ලංකාව තුළට සිදුවූ කණගාටුදායක ප්‍රවේශයන්:

යම් යම් පලිබෝධයන්ට රටට ඇතුලුවීම සඳහා මිනිසා විසින් උදව්කළ බවට අනුමාන කළ හැකි හේතු තිබේ. මේ ප්‍රවේශයන්, වළක්වා-ගත හැකිවූයේ නම්, එම විනාශයෙන්ද ඒ නිසාම වූ සම්පත් නාස්තියද, මහ හරවා ගත හැකිව තිබුනි. අප්‍රිකානු ගොළුබෙල්ලා, රන්වන් කෝෂ්ඨ වටපණුවා, පොල් කුරුමිණියා සහ සැල්විනියා, ප්‍රවේශයන් මේ සඳහා හොඳම උදාහරණ වේ.

**ශ්‍රී ලංකාව තුළට සිදුවූ කණගාටුදායක ප්‍රවේශයන්**

| පලිබෝධයා | විද්‍යාත්මක හැඳින්වීම | බෝගය |
|---|---|---|
| යෝධ අප්‍රිකානු ගොළු බෙල්ලා | ඇකටිනා ෆුලිකා | එළවළු සහ අනිකුත් බෝග |
| වදවීම | වෛරසය | කෙසෙල් |
| අර්තාපල් සලබයා | ජනෝරිමියා ඔපර්කුවෙල්ලා | අර්තාපල් |
| අතු ඉදිමීම | වෛරසය | කොකෝවා |
| පොල් කුරුමිණියා | ප්‍රොමිකොතිකා කුමිංගි | පොල් |
| හරිත එළවළු මකුණා | නේසරා විරිඩුලා | එළවළු |
| සැල්විනියා | සැල්විනියා මොලස්ටා | ජලාශ්‍රිත බෝග හා පරිසරය |
| ජපන් ජබර | චෙයිකෝර්නියා ක්‍රැසිපේස් | —එම— |
| වතුපාලු ශාකය | එවුපැටෝරියම් ඔඩෝරාටුම් | පොල්, රබර් |
| කෝෂ්ය වට පණුවා | හෙටරොඩෙරා රොස්ටොකිඑන්සිස් | අර්තාපල් |
| මලකඩ රෝගය | හෙමිලියා වෙස්ටාට්‍රික්ස් | කෝපි |

නිරෝධායන කාර්යයන්ගෙන් ලැබෙන ප්‍රයෝජනය, ඒ සඳහා යන වියදමට වඩා විශාල වශයෙන් වැඩිවිය යුතුය.

**ශාක නිරෝධායන පිළිබඳ ශ්‍රී ලංකාවේ පනවනු ලැබූ ආඥා පනත්:**

1901 : කෘෂි පලිබෝධයන් සහ නිරෝධායන ආඥා පනත

1907 : ශාක පලිබෝධ ආඥා පනත

1909 : ජපන් ජබර ආඥා පනත, වල් පැලෑටි පිළිබඳ

1924 : ශාක සංරක්ෂණ ආඥා පනත
—උපලේඛනය 1
—උපලේඛනය 11

දැනට බල පවත්වන "ශාක සංරක්ෂණ ආඥා පනත" මගින්, ශාක වලට හානි පැමිණවිය හැකි, වල් පැලෑටි, පලිබෝධ සහ රෝග ශ්‍රී ලංකාව තුළට ප්‍රවේශය සහ රටතුළ පැතිරීම වැළැක්වීම සඳහා සුදුසු නියෝග පැණවීමට කෘෂිකර්ම අමාත්‍යවරයාට බලය දී ඇත.

ශාක ආනයනය පිළිබඳ නියෝග, ශාක සංරක්ෂණ ආඥා පනතේ උපලේඛනයේ 1 කොටස තුළ විස්තර කර ඇත. දැනට බල පවත්වනුයේ, කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් 1981 නොවැම්බර් 02 දින රජයේ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත නියෝගයන්ය. එම නියෝගවලට අනුකූලව, යම් ශාකයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට ප්‍රථමයෙන් ඒ සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂගේ හෝ ඔහුගෙන් බලයලත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගෙන් හෝ ඒ සඳහා අවසර පත්‍රයක් ලබාගත යුතුය. බොහෝ ශාක සඳහා එම අවසර පත්‍ර නිකුත් කිරීම ප්‍රධාන පැලෑටි නිරෝධායන නිලධාරී විසින් කරනු ලබයි.

එහි 2 වන නියෝගයට අනුව ශාක කාණ්ඩ 36 ක් ශ්‍රී ලංකාව තුළට ආනයනය තහනම් කර හෝ සීමා කර ඇත. ඒ අතර, පොල්, රබර්, තේ, වී, කෙසෙල්, රට ඉඳල්, කොකෝවා, කජු, දොඩම්, දෙහි, කරාබු නැටි, කෝපි, කිරි අල, මිදි, අඹ, බතල, මඤ්ඤොක්කා සහ ඒවාට නෑකම් දක්වන ශාකවේ.

මේ අතර, 5 වන නියෝගය යටතේ පස්, සහ 13 වන නියෝගය යටතේ සජීවී කෘමීන්, පක්ෂීන් හෝ වෙනත් සතුන්, වෛරස, බැක්ටීරියා, දිලීර වගාවන් ශ්‍රී ලංකාව තුළට ආනයනය සීමාකර හෝ තහනම් කර ඇත.

එහෙත්, 2 වන නියෝගය යටතට ඇතුලත් කර නැති ශාක සුළු ප්‍රමාණයක්, සීමා කිරීම් වලින් තොරව ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීමට 3 වන නියෝගය යටතේ අවසර ලැබේ.

විශේෂයෙන්ම සඳහන් කළයුතු කරුණක් නම්, රබර්වලට වැළඳෙන "දකුණු ඇමෙරිකානු කොළ දිලීර රෝගය" පවතින රටවලින් කිසිම ශාකයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කර ඇතිබවයි.

අපගේ නීතියෙන්, කෘෂිකර්ම අධ්‍යක්ෂට ලැබී ඇති බලතල අනුව, ශාක ආනයනය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රධාන ක්‍රියා මාර්ගයන් ගැනීමට හැකියාව තිබේ.

1. ආනයනය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම

   උදාහරණ : දකුණු ඇමෙරිකානු කොල දිලීර රෝගය පවතින රටවලින් රබර් ශාක

   ජලජ ශාක

2. විද්‍යාත්මක පර්යේෂණ සඳහා ප්‍රවේශය

ශාක සංරක්ෂණ ආඥා පනතේ වගන්ති අනුව තහනට කර ඇති ඕනෑම ශාකයක සුළු ප්‍රමාණයක් විද්‍යාත්මක පර්යේෂණ සඳහා ආනයනය කිරීමට, 14 වන නියෝගය යටතේ රජයට බාධා නැත. එහිදී රජය විසින් සිය අභිලාෂය කෘෂිකර්ම අධ්‍යක්ෂට ලියවිල්ලකින් දැනුම් දිය යුතුවේ. එවිට ඔහු විසින් සුදුසුයැයි සලකනු ලබන ආරක්ෂා විධිවිධාන සම්බන්ධ කොන්දේසි පැනවිය හැක.

වැඩි සැලකිල්ලක් ඇති ජනක ප්ලාස්ම මේ ගණයට වැටේ. බොහෝ අවස්ථාවලදී, මෙවා ආනයනය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින්ම ශ්‍රී ලංකාවේදී සිදුවේ.

3. ශ්‍රී ලංකාව තුළට ආනයනය කරනු ලැබූ යම් ශාකයකින් දරුණු පලිබෝධයෙකු පැමිණිය හැකියයි සැක කරන අවස්ථාවක, එය කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ස්ථානයක වෙන්කොට තබා වර්ධනය වීමට සැලැස්විය හැක. මෙය පශ්වාත් ප්‍රවේශ නිරෝධායනය වේ. සාමාන්‍යයෙන් මෙසේ රඳවා තබන කාලය මාස 24 ක් නොඉක්මවිය යුතුය. මෙම කාලය තුළදී එම ශාකයේ වර්ධනය, විද්‍යාඥයන් විසින් පරීක්ෂා කරනු ලැබ, ඒ ශාක සම්බන්ධයෙන් කළ යුතුදේ තීරණය කරනු ලබයි.

4. පැමිණිය හැකි පලිබෝධයා ලෙහෙසියෙන්ම හඳුනාගෙන මර්ධනය කළ හැකිනම් සීමා සහිත ප්‍රවේශයන්ට ඉඩදිය හැක. මෙහිදිද නිරෝධායන නිලධාරීන්ට එම ශාක සුපරීක්ෂාකාරී ලෙස නිරීක්ෂණය කළ හැකි එනයේ ආනයනික ශාක ප්‍රමාණය සීමා කෙරේ. එසේ නැති නම් සුදුසු පිළියම් යෙදීමෙන් ආසාදනය වී ඇති පලිබෝධයා විනාශ කළ හැකි නම්, එය අනිවාර්ය ප්‍රවේශ අවශ්‍යතාවයක් ලෙසට කොන්දේසි පැනවිය හැකිය. බොහෝ ශාක ආනයනය කිරීමේදී කෘමි පලිබෝධයන් විනාශ කිරීමට ධූමායනය කිරීම මේ යටතේ ගැනේ. යෙදිය හැකි පිළියම් අතර, පලිබෝධ නාශක යෙදීම, උණු ජලය පාවිච්චිය සහ ශීත කාමරවල නියමිත කාලයක් තැන්පත් කිරීම් යනාදිය කළ හැක.

5. බාධා රහිත එනම් ලිබරල් ප්‍රවේශය- එළවළු බීජ වර්ග ආනයනය මේ යටතේ සිදුවේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිවූ ඕනෑම අයෙකුට මේ කාර්‍යය සඳහා අවසර පත්‍ර ප්‍රධාන පැලෑටි නිරෝධායන නිලධාරී ගෙන් ලබාගත හැක.

සාමාන්‍යයෙන් මෙම ආනයනික බීජ සඳහා නියමාකාර සහතික තිබිය යුතුය.

උදා : බීජ සහතික

උද්භිද සවස්ථතා සහතික

අප රටේ පවතින නියෝගවලට අනුව, ඕනෑම ආනයනික ශාකයක්, කෘෂිකර්ම අධ්‍යක්ෂගේ හෝ ඔහු විසින් බලය දී ඇති පරීක්ෂකවරයෙකුගේ හෝ පරීක්ෂාවට යටත්විය යුතුය. එම ශාක නිරෝධායන පලිබෝධයන්ගෙන් ආසාදනය වී නැතැයි පරීක්ෂකවරයා විසින් සෑහීමට පත්වේ නම්, එමෙන්ම ඒවා විශේෂ සීමාකිරීම් වලට යටත් නොවේ නම්, රට තුළට ප්‍රවේශයට ඉඩ ලැබේ.

ශ්‍රී ලංකාවට ශාක ආනයනය කිරීමේදී අවම කොන්දේසි වනුයේ, එම ශාක අපනයනය කරන රටෙහි බලයලත් නිරෝධායන නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද උද්භිද ස්වස්ථතා සහතිකයක් තිබිය යුතුවීම සහ අපගේ රට තුළට ප්‍රවේශ වන ස්ථානයේ සිටින පැලෑටි නිරෝධායන පරීක්ෂකවරයෙකුගේ පරීක්ෂාවට භාජනය විය යුතුය යන්නයි.

නිරෝධායන තීරණ ගැනීමේදී ජීව විද්‍යාත්මක සාධකයන් කෙරෙහි පමණක් අවධානය යොමු කළ යුතුය. සමාජයීය හෝ දේශපාලනික සාධක අමතක කළ යුතුය. ප්‍රධාන වශයෙන් නිරෝධායන පලිබෝධයන්ගේ ප්‍රවේශය නැවැත්විය හැකි ක්‍රියාමාර්ග ගැන සැලකිය යුතුය.

නිරෝධායන පලිබෝධයන් යනු කිසියම් රටක කෘෂිකර්මයට හෝ පරිසරයට හානි කළ හැකි බවට රජය විසින් නීතිමය වශයෙන් පිළිගෙන ඇති ජීවියෙකුවේ.

ජනක ප්ලාස්ම ආනයනය කිරීමේදී අවදානම වැඩි සහ අවදානම අඩු තත්වයන් ඇත. සෑම අවස්ථාවකදීම අවදානම අඩු තත්වයන් අනුව කරනු ලබන ආනයනයන් ප්‍රශ්න අඩු කරයි. (වගුව 1)

ශාක නිරෝධායනයේදී සලකනු ලබන තවත් කරුණක් නම් අන්තර් මාධ්‍යය පශ්චාත් ප්‍රවේශ නිරෝධායනයයි. උදාහරණයක් ලෙස " දකුණු ඇමෙරිකානු කොළ දිලීර රෝගය" පවතින රටක ප්‍රභවය ඇති රබර් ශාක ආනයනය ගත හැක.

15 වන නියෝගයට අනුව, එම රටවලින් ලබා ගන්නා රබර් ශාක හෝ බීජ, ප්‍රථමයෙන්, එම කලාපයෙන් සහ ආසියානු සහ ශාන්තිකර කලාපයෙන් පිටස්තර ස්ථානයක ඇති පශ්චාත් ප්‍රවේශ නිරෝධායන මධ්‍යස්ථානයක නියමිත කාලයක් වගාකළ යුතුය. එම ශාක නිරෝගී බවට සහතිකයක්ද සමග, ඉන්පසු එම මධ්‍යස්ථානයේ සිට අප රටට ආනයනය කිරීමට අවසර දේ. මෙහිදී ද ශාක අනිවාර්යයෙන්ම පශ්චාත් ප්‍රවේශ නිරෝධායනයට යටත්විය යුතුය. බොහෝ රටවල් නීතිමය මාර්ග වලින්

(වගුව 1)

## අවදානම වැඩි සහ අඩු ප්‍රභවයන්

අවදානම වැඩි | අවදානම අඩු

වනගත සහ ස්වභාවික පරිසරයේ වැඩුණු ශාක —> —> —> පාලක තත්වයන් යටතේ වැඩුණු ශාක

වර්ධිත ශාක —> මුල් රහිත රෝපිත ද්‍රව්‍ය —> බීජ —> —> පටක රෝපණ ද්‍රව්‍ය සහ පරාග

ආරම්භක කේන්ද්‍රස්ථාන —> ප්‍රවේශිත රටවල් —> පර්යේෂණ මධ්‍යස්ථාන —> පශ්චාත් ප්‍රවේශ නිරෝධායන මධ්‍යස්ථාන

නිරෝධායන පලිබෝධයන්ගේ ප්‍රවේශය සහ පැතිරීම වළක්වා ගැනීමට උත්සාහ කරති. එහෙත් ශාක නිරෝධායන ව්‍යාපෘතිය සාර්ථක වනුයේ මහජනයාගෙන් නියමාකාර සහයෝගය ලැබුනහොත් පමණි. කිසිවකු ඕනෑකමින් නීතිය කඩන්නේ නම් දඬුවම් කළ හැකි විය යුතුය. අප රටේදී ඒ කාර්යය සඳහා කල් ගතවේ. අපගේ රටෙහි ශාක නිරෝධායන නීති කඩන්නේ සුළු සිංහල ඇත්තෝ බව ගෞරව පූර්වකව සටහන් කිරීමට කැමැත්තෙමි.

ශාක නිරෝධායනය සාර්ථක විය හැකිද ? ඇත්තෙන්ම නොහැක. හේතුව පලිබෝධයන්ට ඇති බාධක අඩුවීමයි. ධාරකයා යම් තැනෙක ඇති ද, එතැන පලිබෝධයාට සුදුසුවේ.

ජෝන්ස් නම් විද්‍යාඥයාගේ ප්‍රකාශය අනුව ශාක නිරෝධායනය ''පරදින යුද්ධයක'' නිරත වී සිටී. එයට පලිබෝධයන්ගේ පැතිරීම ප්‍රමාද කිරීම පමණක් කළ හැක. සම්පූර්ණයෙන් නැවැත්විය නොහැක. මෙය විද්‍යානුකූලව පරීක්ෂා කළ නොහැකි ප්‍රකාශයකි. එහෙත් පලිබෝධයන්ගේ පැමිණීම ප්‍රමාද කිරීම වුවද ඉතා වැදගත් ප්‍රයෝජනයකි.

## ශ්‍රී ලංකාවට ඇති තර්ජනයන්

| පලිබෝධය | විද්‍යාත්මක හැඳින්වීම | භෝගය |
|---|---|---|
| පළතුරු මැස්සන් | ඇනස්ට්‍රෙපා ලූඩන්ස් | පළතුරු |
| | සෙරාටිටිස් රෝසා | පළතුරු |
| | ඩාකුස් සූනෝඩනීස් | පළතුරු |
| උක් කඳ විදින්නා | ඩයාට්‍රියා සැකාරිලිස් | උක් |
| කොලරාඩො කුරුමිණියා | ලෙප්ටිනොටාර්සා ඩිසෙම්ලිනියාටා | අර්තාපල් |
| බතල වෛරසය | වෛරසය | බතල |
| හෝයා බ්ලොන්කා රෝගය | වෛරසය | වී |
| කැඩං කැඩං රෝගය | විරෝයිඩයකි | පොල් |
| මාරක කහවීම | මයිකොප්ලාස්ම | පොල් |
| කෝෂ්ඨ වටපණුවා | හෙටරොඩෙරා ග්ලයිසින් | සෝයා බෝංචි |
| දකුණු ඇමෙරිකානු කොළ දිලීරය | මික්රොසයික්ලස් උලෙයි | රබර් |
| මොකෝ රෝගය | සූඩොමොනාස් | කෙසෙල් |
| | සොලනාසියාරුම් | |

### ශ්‍රී ලංකාවට ඇති තර්ජන කිහිපයක්

මේ කීපයක් පමණි. තව බොහෝ තර්ජක බලාපොරොත්තු විය හැක. ශාක නිරෝධායනයේ පරමාර්ථය මෙම තර්ජනාත්මක පලිබෝධයන්ගේ ප්‍රවේශය නැවැත්වීමයි.

ඒ සඳහා ඔබ සියල්ලන්ගේම සහයෝගය අවශ්‍යවේ.

# දයාබර පාඨක හිතවතුනි.

## ගොවිකම් සඟරාව දනට අලෙවිය සඳහා ඇති ස්ථානයන් මෙසේය

**මහනුවර දිස්ත්‍රික්කය**

- බීජ වෙළඳ සැල - ගන්නොරුව
- බීජ වෙළඳ සැල - කුණ්ඩසාලේ ගොවිපල

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

- ගල්පාලම දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය
- සීතාඑළිය අර්තාපල් ගොවිපල
- සත්ව පාලන ගොවිපල - බොරලන්ද

**දකුණු පළාත**

- වීරවිල දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය
- අඟුණකොළපැලැස්ස සේවා සංයිකරණ ආයතනය
- අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

- පුලියන්කුලම ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය

- මීට අමතරව ගන්නොරුව ප්‍රකාශන අංශය වෙතින්ද ඔබට මෙම සඟරාව මිළට ගත හැක

---

**යමෙක් වත් පොහොසත්කම් ඇතිව සිටියදී තම සහෝදරයාගේ අඟ හිඟකම් දක දකත් ඇස් පියාගෙන සිටී නම්, දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඔහුට හිමි වන්නේ කෙසේද ?**

**මාගේ දරුවනි, උපකාරය—ප්‍රේමය දක්විය යුත්තේ වචනයෙන් වත් හැඟුමෙන් වත් හෝ නොව මුළු හදවතෙන්මය.**

( ශුද්ධවූ ලියවිල්ල )

---

**National Digitization Project**

***National Science Foundation***

Institute : Department of Agriculture

1. Place of Scanning : Department of Agriculture, Peradeniya
2. Date Scanned : .......2018./..1./..9.......................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : .....G..E..P.....Dilshan...............................................

Signature : ............................................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief.....Librarian...........................................

Name : Saumya.....Upamalika.......................................

Signature : .........................................................................

Date : ............2018./..1..19........

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*